#  ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2149/20 - 2019 නොවැම්බර් මස 14 වැනි බ්‍රහස්පතින්දා - 2019.11.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 3/2012(xiii)

**2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත**

2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 48 වන වගන්තියේ (3), (6), හා (7) වන උපවගන්ති සමග සහ 50 වන වගන්තියේ (1) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 69 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ උපදෙස් මත සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග,
සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි
ආගමික කටයුතු අමාත්‍ය.

කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2019 අංක 2 දරන සංචාරක කටයුතු (ආයුර්වේද හෝටල් ලියාපදිංචි කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. කිසිම තැනැත්තකු විසින් ආයුර්වේද හෝටල් ව්‍යාපාරය (මෙහි මින්මතු ''අධිකාරිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇත්නම් හා අධිකාරියෙන් එම ව්‍යවසාය සඳහා බලපත්‍රයක් ලබාගෙන ඇත්නම් මිස, එම ව්‍යාපාරය සංචාරක ව්‍යවසායක් වශයෙන් පවත්වාගෙන නොයා යුතු ය.

3. 2016 අප්‍රේල් මස 20 දින අංක 1963/28 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 අංක 01 දරන සංචාරක කටයුතු (සංචාරක හෝටල් වර්ගීකරණය කිරීමේ) නියෝගයන් හි විධිවිධාන, ආයුර්වේද සංචාරක හෝටල් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

1A - G 31457 — 27 (2019/11)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## I වන කොටස

### *ආයුර්වේද හෝටල් ලියාපදිංචි කිරීම*

4. ලියාපදිංචි සංචාරක ව්‍යවසායක් වශයෙන් ආයුර්වේද හෝටලයක් ලියාපදිංචි කිරීමට අපේක්ෂාවෙන් සිටින සෑම තැනැත්තකු විසින් ම :-

(අ) (මෙහි මින්මතු ''අධ්‍යක්ෂ ජනරාල්වරයා'' යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත, ඔහු විසින් තීරණය කරනු ලබන ආකෘතියකට අනුකූලව අයදුම්පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය ; සහ

(ආ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 48 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ සාදන ලද සහ 2018 මැයි මස 16 වන දින අංක 2071/57 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ, නිශ්චිතව දක්වා ඇති ගාස්තු ඒ සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

5. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම අයදුම්පත පිළිබඳව තීරණය කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි බවට ඔහු විසින් සලකනු ලබන යම් පැහැදිලි කිරීම් ද ඇතුළුව ඒ හා සම්බන්ධ තවදුරටත් වූ තොරතුරු හෝ ලේඛණ ඔහු වෙත ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

6. සාවද්‍ය, නොමගයවනසුලු හෝ අසත්‍ය තොරතුරු හෝ විස්තර අන්තර්ගත බවට අනාවරණය වන යම් අයදුම්පතක් ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

7. මෙහි සඳහන් අවශ්‍යතා අයදුම්කරු සන්තකයේ පවතින බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සෑහීමකට පත්වන අවස්ථාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම අයදුම්කරු එම ආයුර්වේද හෝටලයේ ලියාපදිංචි හිමිකරු වශයෙන් ලියාපදිංචි කරනු ලැබිය යුතු අතර එම ලියාපදිංචි හිමිකරු වෙත ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

8. එම ආයුර්වේද සංචාරක හෝටලය ලියාපදිංචි කිරීමෙන් පසු, අධිකාරිය විසින් එම ව්‍යවසායේ අවම ප්‍රමිතීන් ඇතුළත් ප්‍රමිති සහතිකයක් එම ආයුර්වේද හෝටලයේ හිමිකරු වෙත නිකුත් කරනු ලැබිය හැකි ය.

## II වන කොටස

### *ලියාපදිංචි ආයුර්වේද හෝටල් සඳහා බලපත්‍ර ප්‍රදානය කිරීම*

9. (1) මේ නියෝග යටතේ ආයුර්වේද හෝටල් ව්‍යාපාරයක් පවත්වාගෙන යැමට අපේක්ෂාවෙන් සිටින සෑම තැනැත්තකු විසින් ම :-

(අ) අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත, ඔහු විසින් තීරණය කරනු ලබන ආකෘතියකට අනුකූලව අයදුම්පතක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය ; සහ

(ආ) 2005 අංක 38 දරන සංචාරක පනතේ 48 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ සාදන ලද සහ 2018 මැයි මස 16 වන දින අංක 2071/57 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තු එම අයදුම්පත සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන ඡේදය යටතේ වූ සෑම අයදුම්පතක් ම ආයුර්වේද හෝටලයේ ශක්‍යතාවය හා හැකියාව විස්තර කරනු ලබන සවිස්තර වාර්තාවක් සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

10. බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා යම් ආයුර්වේද හෝටලයක හිමිකරුගෙන් අයදුම්පතක් ලැබීමෙන් පසුව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, එම බලපත්‍රය නිකුත් කිරීම සඳහා එම ඉල්ලීමට අදාළ තවදුරටත් වූ තොරතුරු ලේඛණ හෝ පැහැදිලි කිරීම නිශ්චිතව දක්වනු ලබන කාලසීමාවක් ඇතුළත දී ඉදිරිපත් කරන ලෙස එම අයදුම්කරුට විධානය කරනු ලැබිය හැකි ය.

11. (අ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ආයුර්වේද හෝටලයක් සඳහා වූ ප්‍රමිති සහතිකයේ නිශ්චිතව දක්වා ඇති අවම ප්‍රමිතීන් අයදුම්කරු විසින් සපුරා ඇති බවට සෑහීමට පත්වීමෙන් පසුව, ඔහු විසින් ආයුර්වේද හෝටලයේ හිමිකරු වෙත බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(ආ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සිය තීරණය එක් මාසයක කාලයක් ඇතුළත අයදුම්කරු වෙත ලිඛිතව දැනුම් දිය යුතු අතර බලපත්‍රය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී, ඔහු විසින් ඒ පිළිබඳ හේතු සඳහන් කරනු ලැබිය යුතු ය.

12. මේ නියෝගවල 11 වන නියෝගය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රය -

(අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගවලට එකඟව යථා පරිදි ක්‍රියා කිරීම සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් උචිත බවට සලකනු ලබන බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති නියම හා කොන්දේසිවලට යටත් කළ හැකි ය ;

(ආ) එහි නිශ්චිතව දක්වා ඇති දිනයේ දී බලාත්මක විය යුතු ය ; සහ

(ඇ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කලින් අවලංගු කරනු ලැබුවහොත් හෝ ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබුවහොත් මිස, එම බලපත්‍රයේ නිශ්චිතව සඳහන් දිනයේ සිට වසරක කාලයක් සඳහා බලාත්මකව පැවතිය යුතු ය.

## III වන කොටස

### *සාමාන්‍ය විධිවිධාන*

13. අයදුම්කරු -

(අ) මේ නියෝග යටතේ ආයුර්වේද හෝටලයක් පිළිබඳ සංචාරක ව්‍යවසාය ලියාපදිංචි කිරීමට හෝ එහි ලියාපදිංචි හිමිකරු වශයෙන් තමාව ලියාපදිංචි කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී ; හෝ

(ආ) මේ නියෝගය යටතේ නිකුත් කරන ලද ප්‍රමිති සහතිකයේ නිශ්චිතව සඳහන් අවම ප්‍රමිතීන්වලට අනුකූලවීමට අපොහොසත් වී ඇති අවස්ථාවක දී ;

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 11 වන නියෝගය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

14. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අධිකාරියේ අනුමැතිය ඇතිව, ලියාපදිංචි සහතිකයට හෝ බලපත්‍රයට අමුණා ඇති යම් යම් නියමයක් හෝ කොන්දේසියක් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

15. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, පහත දැක්වෙන හේතු මත මේ නියෝගවල 7 වන නියෝගය යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකය හෝ 11 වන නියෝගය යටතේ නිකුත් කරන ලද බලපත්‍රය -

(අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ යම් විධිවිධානයක උල්ලංඝනය කර තිබීම හේතුවෙන් ;

(ආ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය කර තිබීම හේතුවෙන් ; හෝ

(ඇ) 7 වන නියෝගය යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයට අමුණා ඇති හෝ 11 වන නියෝගය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයට අමුණා ඇති යම් කොන්දේසියකට අනුකූලව ක්‍රියාකර නොමැති වීම හේතුවෙන් ;

අවලංගු කරනු ලැබිය හැකි ය.

16. මේ නියෝගවල 11 වන නියෝගය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් -

(අ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන ආකෘතියකට අනුකූලව ඔහු වෙත අයදුම්පතක් ඉදිරිපත් කිරීම මගින් ;

(ආ) බලපත්‍රය කල් ඉකුත්වීමට පෙරාතුව වූ මාස තුනකට වැඩි නොවන කාලයක් තුළ දී ; සහ

(ඇ) 2018 මැයි මස 16 වන දින අංක 2071/57 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 48 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ සාදන ලද නියමය ප්‍රකාරව ගෙවිය යුතු ගාස්තු සහිතව අයදුම්පත යොමු කිරීම මගින් ;

අලුත් කරනු ලැබිය හැකි ය.

17. ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමක් හෝ නිකුත් කරන ලද බලපත්‍රයක් අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමක් හෝ නිකුත් කරන ලද බලපත්‍රයක් අවලංගු කිරීමක් පිළිබඳ යම් තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් අවස්ථාවෝචිත පරිදි එම බලපත්‍රය ප්‍රතික්ෂේප කිරීම හෝ අවලංගු කිරීම පිළිබඳව දැනුම් දෙමින් ලිඛිත සන්නිවේදනයක් එම තැනැත්තා වෙත ලැබීමේ දින සිට මාස එකක කාලයක් ඇතුළත, 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 51 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විනිශ්චයාධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

18. සෑම ලියාපදිංචි සහ බලපත්‍රලාභී ආයුර්වේද හෝටලයක හිමිකරුවකු විසින් ම එම ලියාපදිංචි ආයුර්වේද හෝටලය මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අවම අවශ්‍යතාවලට අනුකූල වන බවට සහතික විය යුතු ය.

19. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලියාපදිංචි බලපත්‍රලාභී ආයුර්වේද හෝටලයක් පිළිබඳව අන්තර්ගත විය යුතු විස්තර සහිත ආයුර්වේද හෝටල් පිළිබඳ ලේඛනයක්, ඔහු විසින් තීරණය කරනු ලබන ආකෘතියෙන් පවත්වාගෙන යෑමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

20. මේ නියෝගවල -

''ආයුර්වේද හෝටලය'' යන්නෙන් ආගන්තුක මනස, ශරීරය හා ආධ්‍යාත්මික යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා ස්වදේශීය හා පාරම්පරික ආයුර්වේද සෞඛ්‍ය සේවා පහසුකම් සැපයීමට යොමු වූ ව්‍යවසායක් අදහස් වේ.

## උපලේඛනය

(18 වන වගන්තිය)

1.0 ආයුර්වේදීය සෞඛ්‍ය හෝටලයක් සඳහා අවශ්‍යවන අවම අවශ්‍යතා -

**1.1 පිහිටීම**
විශේෂයෙන් වර්ග කරන ලද හෝටලය හෝ කුඩා හෝටලයට අදාළ වූ අවම අවශ්‍යතාවලට අනුකූල විය යුතු ය.

**1.2 ගොඩනැගිල්ල**
ආයුර්වේදීය සෞඛ්‍ය සේවා සැපයීම සඳහා සුදුසු පරිදි නිර්මාණය කළ සහ ඉදිකල ගොඩනැගිලි විය යුතු ය.

**1.3 මිදුල**
මිදුල සහ උයන ආයුර්වේදීය සෞඛ්‍ය සේවාවන්ට අදාළ අවශ්‍යතාවලට අනුකූල වන පරිදි මනාව සකස්කර පවත්වා ගෙන යායුතු අතර එහි ආයුර්වේදීය ඖෂධීය ශාක වගා කිරීම යෝග්‍ය වේ.

**1.4 වාහන නවතා තැබීම**
ආයුර්වේද සෞඛ්‍ය කොට්ඨාසවල ආගන්තුකයන් සඳහා වෙන් කරන ලද වාහන නතර කිරීමේ ඉඩකඩ තිබිය යුතු ය.

**1.5 පිළිගැනීම/තොරතුරු**
ආගන්තුකයන් සඳහා ආයුර්වේදීය සෞඛ්‍ය සේවය පිළිබඳ සවිස්තර තොරතුරු ලබාගැනීම සහ සැපයීම සඳහා වෙන් කරන ලද පිළිගැනීමේ/තොරතුරු කවුළුවක් තිබිය යුතු ය.

**1.6 රෝගී පරීක්ෂණාගාර සහ ආගන්තුක රැඳී සිටීමේ කාමර**

1.6.1 වෛද්‍යවරුන් සඳහා ප්‍රමාණවත් ඉඩකඩ සහ පහසුකම් සහිත වූ රෝගී පරීක්ෂණාගාර එකක් හෝ ඊට වැඩි ගණනක් තිබිය යුතු ය.

1.6.2 මේ කාමර සීමාංකනය කර ප්‍රමාණවත් පරිදි ආලෝකමත් කර වාතාශ්‍රය ලැබීමට සලස්වනු ලැබිය යුතු අතර මනාව නඩත්තු කරනු ලැබිය යුතු ය.

1.6.3 වෛද්‍යවරුන් සඳහා මෙන්ම ප්‍රතිකාර සඳහා පැමිණෙන ආගන්තුකයන් සඳහා ද සුව පහසු ආසන පහසුකම් සැපයිය යුතු ය.

1.6.4 ආයුර්වේද දෙපාර්තමේන්තුව හෝ ආයුර්වේද වෛද්‍ය සභාව මගින් විශේෂඥභාවය දක්වමින් නිකුත් කරන ලද ආයුර්වේද වෛද්‍යවරයාගේ සහතිකයේ පිටපතක් ආගන්තුක රැඳී සිටීමේ කාමරයේ හෝ රෝග පරීක්ෂණාගාරයේ ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

**1.7 ආයුර්වේද ප්‍රතිකාර වර්ග**

ආයුර්වේද සෞඛ්‍ය ඒකකය පහත දැක්වෙන ආයුර්වේද ප්‍රතිකාර වර්ග සපයනු ලැබිය යුතු ය.

1.7.1 පූර්ව කර්ම (ස්නේහ සහ ස්වේද කර්ම) එනම්, (අ) තෛල අබියන්ග සහ ගීර අබියන්ග, (ආ) ශීරෝධාර, (ඇ) සර්වාංගධාර, (ඈ) පින්ද සහ වාෂ්ප ස්වේධ (ඉ) අග්නි සහ නිරංග ස්වේධ

1.7.2 ප්‍රධාන කර්ම (පංච කර්ම) එනම්, (අ) වාමන කර්ම, (ආ) විරෝධාන කර්ම, (ඇ) නාස්ය කර්ම, (ඈ) වාස්ති කර්ම (ඉ) රක්ත මෝක්ෂණ කර්ම

1.7.3 පශ්චාත් කර්ම, එනම් (අ) පත්ය ආහාර විහරණ

1.7.4 ක්ෂුද්‍ර කර්ම, එනම් (අ) ගන්ධූෂ, (ආ) කවලන් ග්‍රහ සහ (ඇ) අක්සි තර්පන

1.7.5 ශාමන කර්ම, එනම් (අ) දීපන, (ආ) පාචන (ඇ) අතප සහ (ඈ) සෙවන.

**1.8 ප්‍රතිකාර කාමර**

1.8.1 ප්‍රතිකාර කාමර පොදු ප්‍රදේශ වලින් ඈත්ව පිහිටා තිබිය යුතු අතර කාමර තුළ සහ ඉන් අවට ප්‍රමාණවත් පුද්ගලිකත්වයක් තිබිය යුතු ය.

1.8.2 සම්බාහන (ආ) හුමාල ස්නාන, (ඇ) වෙනත් ප්‍රතිකාර, (ඉ) ඖෂධීය ස්නාන (ඊ) කටු චිකිත්සාව (සපයා ඇත්නම්), භාවනාව සහ යෝග සහ උපදේශනය වැනි චිකිත්සීය ප්‍රතිකාර බලාපොරොත්තු වන ආගන්තුකයන්ගේ සංඛ්‍යාවට හා කාමරවල සංඛ්‍යාවට අදාළව ප්‍රමාණවත් ප්‍රතිකාර කාමර සංඛ්‍යාවක් සපයනු ලැබිය යුතු ය.

1.8.3 ස්ත්‍රී සහ පුරුෂ අමුත්තන් සඳහා වෙන් වූ ප්‍රතිකාර කාමර තිබිය යුතු ය.

1.8.4 ප්‍රතිකාර කිරීමේ කාර්යය සඳහා පහත දැක්වෙන පහසුකම් සහ උපකරණ තිබිය යුතු ය. එනම්,

(අ) පරීක්ෂා කිරීම සඳහා ඇඳ/ඇඳන්,
(ආ) සම්බාහනය සඳහා දැවමය ඇඳන්/ශීරෝධාර, සහ
(ඇ) හුමාලය ඇල්ලීම සඳහා දැවයෙන් සාදන ලද (කොහොඹ යෝග්‍ය වේ) මංජුසා.

1.8.5 ප්‍රතිකාර කාමර තුළ ප්‍රමාණවත් ආලෝකය සහ වාතාශ්‍රය තිබිය යුතු ය.

1.8.6 ප්‍රමාණවත් වතුර මල් ප්‍රමාණයක් තිබිය යුතු ය.

1.8.7 සියලු ආගන්තුකයන්ට නාන කබා, නාන තුවා, මුහුණු තුවා, අත් තුවා, ඇඳ රෙදි, ආඝ්‍රාණක රෙදි, උතුරු සළු සහ ඇස් ආවරණ ඇතුළු පිරිසිදු සහ සනීපාරක්ෂක කපු රෙදි සපයනු ලැබිය යුතු ය.

**1.9 පශ්චාත් ප්‍රතිකාර විවේකාගාරය/ප්‍රදේශ**

1.9.1 වෙන් වූ පශ්චාත් ප්‍රතිකාර විවේකාගාරයක් හෝ ප්‍රතිකාරවලින් අනතුරුව විවේක ගැනීම සඳහා ප්‍රදේශයක් තිබිය යුතු ය.

1.9.2 එය අවශ්‍ය උපාංගවලින් සමන්විත විය යුතු අතර විවේක ගත හැකි පුටු සපයා තිබිය යුතු හා එම ස්ථානය කලබලකාරී නොවන ස්වභාවයෙන් පවත්වාගෙන යා යුතු ය.

**1.10 ඖෂධාල/ඖෂධ සැකසීමේ කාමර**

1.10.1 ආයුර්වේදීය සැපයුම් ගබඩා කිරීමට සහ ඖෂධ සැකසීමට ඉඩකඩ සහිත ඖෂධාලයක් තිබිය යුතු ය.

1.10.2 ඖෂධ සැකසීම සුදුසුකම්ලත් ආයුර්වේද වෛද්‍යවරයකුගේ හෝ ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇති සුදුසුකම්ලත් ඖෂධවේදීයකුගේ අධීක්ෂණය යටතේ සිදු කළ යුතු ය.

1.10.3 වෛද්‍ය උපකරණ ගබඩා කිරීම සඳහා සුදුසු රාක්ක සහ ගබඩා උපකරණ සපයනු ලැබිය යුතු අතර ඖෂධ මිශ්‍ර කිරීම සහ සැකසීම සඳහා මේස, උපකරණ සහ භාජන සපයනු ලැබිය යුතු ය.

1.10.4 ඖෂධාලය තුළ උණු දිය සහ සිසිල් දිය සහිත සේදුම් බේසමක් සවිකල යුතු ය.

1.10.5 සියලුම බෙහෙත්/ඖෂධ, අනුමත උපකරණ යොදා ගනිමින් පිළිගත් ප්‍රමිතීන්ට අනුව සකසනු ලැබිය යුතු ය.

1.10.6 නිෂ්පාදිත බෙහෙත් සහ අමුද්‍රව්‍ය වෙන වෙනම ගබඩා කළ යුතු ය.

1.10.7 සුදුසු සහ ප්‍රමාණවත් තාපන සහ පැසවීමේ ක්‍රම අනුගමනය කළ යුතු ය.

1.10.8 ඖෂධවේදියා විසින් නිෂ්පාදිත දිනය, කල් ඉකුත්වීමේ දිනය, භාවිතා කර ඇති ද්‍රව්‍ය සහ සැපයුම්කරුවන්ගේ සහ නිෂ්පාදකයන්ගේ විස්තර ඇතුළත් ලේඛණයක් සියළු ඖෂධාලවල පවත්වාගෙන යා යුතු ය.

1.10.9 ආයුර්වේද සෞඛ්‍ය ඒකකය විසින් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි නිෂ්පාදකයන් වෙතින් නිෂ්පාදිත ඖෂධ මිලදී ගත යුතු අතර අදාළ ප්‍රමිති සහතිකයන්ට ඒවා අනුකූලවිය යුතු ය.

**1.11 ඖෂධ පැළෑටි සම්බන්ධ මුළුතැන්ගෙය.**

1.11.1 අවශ්‍ය ඝන හෝ දියරමය ඖෂධ පැළෑටි ආශ්‍රිත නිෂ්පාදන, කසාය, ආලේප සහ පොට්ටනි සැකසීම සඳහා දැනුම සහ අත්දැකීම සහිත ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සහිත ඖෂධ පැළෑටි සම්බන්ධ මුළුතැන්ගෙයක් තිබිය යුතු ය.

1.11.2 සියලු ආයුර්වේදීය ඖෂධ සැකසීම සඳහා සෞඛ්‍ය ඒකකයෙහි භාවිතා කරන්නා වූ උපකරණ සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අනුමැතිය තිබිය යුතු ය.

**1.12 අනියම් වැසිකිළි ඒකක**

1.12.1 පුරුෂයන් සහ ස්ත්‍රීන් සඳහා වෙන් වූ අනියම් වැසිකිළි ඒකක තිබිය යුතු ය.

1.12.2 අවශ්‍යතාවය පරිදි වෙන ම ඇඳුම් මාරු කිරීමේ කාමර තිබිය යුතු ය.

1.12.3 සෑම වැසිකිළි ඒකකයක් සඳහා ම ජල මුද්‍රිත වැසිකිළි සේදුම් බේසම්, කණ්ණාඩි, තුවා රඳවන, ඇඳුම් රඳවන, පිරිසිදු තුවා, කඩදාසි මලු සහිත සනීපාරක්ෂක කුඩ, සබන්, සබන් තබන බන්දේසි, රඳවන සහිත වැසිකිළි කඩදාසි, බිඩේ හෝ හැන්ඩ් බිඩේ (අතින් ක්‍රියා කරවන දෝවනය) සහ උණුදිය හා සිසිල් දිය සපයනු ලැබිය යුතු ය.

1.12.4 අනියම් වැසිකිළි ඒකකවල තිබෙන්නා වූ උපකරණ සහ සවි කිරීම් මනා ක්‍රියාකාරී තත්වයෙන් පැවතිය යුතු ය.

1.12.5 ප්‍රමාණවත් පරිදි වෙන ම වතුර ෂවර ප්‍රමාණයක් තිබිය යුතු ය.

1.12.6 වැසිකිළි ඒකක ප්‍රමාණවත් ව ආලෝකමත් කර වාතාශ්‍රය සහිතව මනාව නඩත්තු කළ යුතු ය.

1.12.7 වැසිකිළියේ බිම සහ බිත්ති 1.5m දක්වා ජලය අවශෝෂණය නොකරන ද්‍රව්‍යයකින් සාදා තිබිය යුතු ය.

1.13 කාර්ය මණ්ඩලය සහ පහසුකම්

1.13.1 ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් පිළිගත් ආයතනයකින් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් ලබා ඇති සහකාර වෛද්‍යවරයෙකු සමග ආයුර්වේද දෙපාර්තමේන්තුවේ හෝ ආයුර්වේද වෛද්‍ය සභාවේ අනුමැතිය ලත් උපදේශක වෛද්‍යවරයකු වශයෙන් ආයුර්වේද සෞඛ්‍ය ඒකකයට සම්බන්ධව කටයුතු කරන ආයුර්වේද වෛද්‍යවරු අවම වශයෙන් එක අයකුවත් සිටිය යුතු ය. ඕනෑම පාරම්පරික දේශීය වෛද්‍යවරයෙක්, ඔහුගේ ඔප්පු කරන ලද සේවා වාර්තා මත ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් අවසරය ලබාගෙන තිබිය යුතු ය.

1.13.2 ආයුර්වේද ප්‍රතිකාර සම්බන්ධ අවම වශයෙන් මාස හයක පුහුණුවක් ලබා ඇති පිරිමි සහ කාන්තා ප්‍රතිකාර කරන්නන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සිටිය යුතු අතර ඔවුන්ගේ පුහුණු සහතිකය ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් අනුමත කරනු ලැබ තිබිය යුතු ය.

1.13.3 පිළිවෙලින් පිරිමි සහ කාන්තා රෝගීන් සඳහා ප්‍රතිකාර කිරීමට ආයුර්වේදය සම්බන්ධව අවම වශයෙන් මාස හයක පුහුණුවක් සහ ප්‍රායෝගික අත් දැකීම් සහිත පිරිමි සහ කාන්තා උපස්ථායකයින් සිටිය යුතු ය.

1.13.4 වෛද්‍යවරයා හෝ කාර්ය මණ්ඩලයේ අවම වශයෙන් එක් සාමාජිකයකුවත් ඉංග්‍රීසි භාෂාව හෝ වෙනත් අදාළ යම් විදේශීය භාෂාවක ප්‍රවීණයකු විය යුතු ය.

1.13.5 කාර්ය මණ්ඩලයේ භාවිතය සඳහා ක්‍රියාකාරී ජල මුද්‍රිත වැසිකිළි සහිත වෙන් වූ පිරිසිදු වැසිකිළි පැවතිය යුතු ය.

1.13.6 පිරිමින් හා කාන්තාවන් සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ හා ගෘහ උපකරණවලින් සමන්විත වූ වෙනම කාර්ය මණ්ඩල ඇඳුම් මාරු කිරීමේ කාමර තිබිය යුතු ය.

1.13.7 කාර්ය මණ්ඩලය රාත්‍රියෙහි නැවතී සිටි නම් ප්‍රමාණවත් නවාතැන් පහසුකම් සැලසිය යුතු ය.

1.13.8 ආයුර්වේද සේවා සැපයීම සඳහා යෝග්‍ය වූ නිළ ඇඳුම් කාර්ය මණ්ඩලයට සැපයිය යුතු ය.

1.13.9 යෝග්‍ය ලෙස සූදානම් කළ සහ සැකසූ කෑම කාමර කාර්ය මණ්ඩලය සඳහා තිබිය යුතු ය.

1.14 සාමාන්‍ය

1.14.1 අවශ්‍යතාවය පරිදි ප්‍රථමාධාර සහ රෝහල් මාරු කිරීම් වැනි හදිසි වෛද්‍ය පහසුකම් හෝ පිළියෙළ කිරීම් පැවතිය යුතු ය.

1.14.2 ප්‍රතිකාර ලබා දුන් හෝ ඖෂධ නිර්දේශ කරන තැනැත්තා විසින්, වෛද්‍ය ආකෘතීන්, නිර්දේශ කරන ලද ඖෂධ ඇතුළත් රෝගීන්ගේ ඉතිහාස වාර්තා, ආගන්තුකයන්ගේ වාර්තා පවත්වාගෙන යා යුතු අතර ඉල්ලීම මත ඒවා සැපයීමට හැකියාව තිබිය යුතු ය.

1.14.3 ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් සහතිකයක් ලබා ගත යුතු ය.

1.14.4 අවමය රුපියල් මිලියන පහක් සමග මහජන වගකීම ද සහිත රක්ෂණ ආවරණයක් ලබාගත යුතු ය.

11 - 1643

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.